ජාතික සමාජ සංවර්ධන ආයතනය - 2020
------------------------------------

# 1. මූල්‍ය ප්‍රකාශන
-----------------------

## 1.1 තත්ත්වාගණනය කළ මතය
---------------------------------

ජාතික සමාජ සංවර්ධන ආයතනයේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, ආයතනයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම
-----------------------------------------------

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්
------------------------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය ආයතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

-----------------------------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ආයතනයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ආයතනය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

---------------------------------------------------------------------

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

---------------------------------------------------------------

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරීබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ආයතනය විසින් පවත්වාගෙන යන බැංකු ගිණුම් දෙකකට අදාල මුදල් පොත් පැවැත්වීම චෙක්පත් ලිවීම සහ නිකුත් කිරීම, මාසික ගිණුම් සාරාංශ සකස් කිරීම සහ චෙක්පත් දින දීර්ඝ කිරීම ගොනු පවත්වාගෙන යාම යන සියළුම කාර්යයන් ආයතනයේ ගිණුම් අංශයේ එක් කළමනාකාර සහකාර නිලධාරියෙක් විසින් සිදුකර තිබූ අතර අභ්‍යන්තර පරීක්ෂාවකට ලක්වන ආකාරයෙන් වැඩ පැවරීම් සිදුකර නොතිබුණි. | ආයතනයේ ගිණුම් අංක 143-1001-0-3298037 හා 143 – 100123298038 ලෙස ජංගම ගිණුම් 02 ක් පවතී. මෙම ගිණුම් 02 සඳහාම මෙපමණ කලක් එක් කළමණාකරන සහකාරවරියක් යොදවා තිබුණි. මේ වන විට ආයතනයේ ගණකාධිකාරී හා ගිණුම් නිළධාරී යන තනතුරු 02 ට පුරප්පාඩුව පවතී. 2021 මැයි 28 ගැසට් පත්‍රය මඟින් මෙම තනතුරු 02 ට අයදුම්පත් කැඳවා තිබුණි. covid 19 වසංගතය නිසා ආයතනය වසා තැබීම හා සංචරණ සීමා පැනවීම හේතුවෙන් සම්මුඛ පරික්ෂණ පවත්වා නව බඳවා ගැනීම් සිදු කිරීම ප්‍රමාදව ඇත. නව බඳවා ගැනීම් සිදු කළ පසු විගසම මෙම වරද නිවැරදි කරන බවට දන්වා | ආයතනයේ අභ්‍යන්තර පාලන පද්ධතිය නිසි පරිදි ක්‍රියාත්මක කල යුතුය. |

සිටිමි.

### 1.5.2 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| **(අ)** ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 2 ප්‍රකාරව මූල්‍යයන ක්‍රියාකාරකම් තුලින් ඇතිවන මුදල් ප්‍රවාහයන් මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහය තුල දැක්විය යුතු වුවත් රු.8,309,475 ක් ප්‍රාග්ධන ප්‍රදාන මෙහෙයුම් ක්‍රියාකාරකම් තුල පෙන්වා තිබුණි. | මේ සමග ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රවාහයේ මෙය නිවැරදි කර ඉදිරිපත් කර ඇත. | අදාල ගිණුම්කරණ ප්‍රමිතීන් ප්‍රකාරව කටයුතු සිදුකළ යුතු වීම. |
| **(ආ)** මුදල් ප්‍රවාහයට අදාල නොවූ පූර්ව වර්ෂ ගැලපුම් රු.172,239ක් ශ්‍රිලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 2ට පටහැනිව මෙහෙයුම් ලාභයට ගලපා තිබුණි. | 2020 වාර්ෂික මූල්‍ය ප්‍රකාශයන්හි අන්තර්ගත ස්කන්ධ වෙනස්වීම් ප්‍රකාශයේ සමුච්චිත අරමුදල් යටතේ පෙර වර්ෂයන්ට අදාළ ගැලපීම ලෙස රු.172,239ක් නිවැරදිව පෙන්නුම් කර ඇතත්, ප්‍රමාද දෝෂයකින් එම සංඛ්‍යාව මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මෙහෙයුම් ලාභයට ගලපා පෙන්නුම් කර ඇත. | අදාල ගිණුම්කරණ ප්‍රමිතීන් ප්‍රකාරව කටයුතු සිදුකළ යුතු වීම. |
| **(ඇ)** මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ අස්පෘෂ්‍ය වත්කම් ලෙස දැක්වෙන රු.2,037,760ක් වූ පාඨමාලා හදාරන සිසුන්ගේ තොරතුරු ඇතුළත් කිරීමට ස්ථාපනය කරන ලද තොරතුරු පද්ධතිය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම් ප්‍රමිත අංක 20 ප්‍රකාරව ක්ෂය කර නොතිබුණි. | රු 2,037,760 ක පිරිවැයක් දරා ස්ථාපිත කරන ලද ශිෂ්‍ය තොරතුරු පද්ධතිය 2020 වර්ෂයේ සිට ක්‍රියාත්මක වුවද, ක්‍රියාත්මක කිරීමේ දී අනාවරණය වූ දෝෂයන් නිවැරදි කිරීම පරිගණක මෘදුකාංගය සපයන ලද වැඩ සටහන් සම්පාදකවරුන් විසින් වර්ෂය තුලදී සිදු කර ඇත.තවද ඉහත පිරිවැයෙන් රු.224,000 ක මුදලක් තවදුරටත් පද්ධතිය නිසි ආකාරව ක්‍රියාත්මක වන තෙක් රඳවා ගෙන ඇත. රැදවුම් මුදල් නිදහස් කල පසුව ගිණුම්කරණ ප්‍රතිපත්ති වලට අනුව සියයට 25ක් වාර්ෂිකව ක්ෂය කිරීමට පියවර ගනු ඇත. | අදාල ගිණුම්කරණ ප්‍රමිතීන් ප්‍රකාරව කටයුතු සිදුකළ යුතු වීම.<br>. |

### 1.5.3 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| **(අ)** ආයතනය විසින් පවත්වාගෙන යන බැංකු ගිණුමකට අදාළ බැංකු සැසඳුම් ප්‍රකාශය අනුව 2020 දෙසැම්බර් 31 දිනට හඳුනා නොගත් ආදායම රු.3,308,461ක් විය. එය පිළිවෙලින් 2019 හා 2020 වර්ෂවලට අදාලව රු.1,374,832 ක් හා රු.1,933,629 ක් වූ අතර මෙම ආදායම් හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි. | පාඨමාලාවන් සඳහා ශිෂ්‍යයින් විසින් ඍජුවම මුදල් බැංකුගත කර අදාළ කුවිතාන්සිය ආයතනය වෙත ලබා නොදීම හේතුවෙන් මෙම මුදල් හඳුනාගැනීමට ප්‍රමාද වී තිබේ. මේ සඳහා ආයතනය විසින් නව මුදල් බැදීමේ වව්වර්පතක් හඳුන්වා දී ඇති අතර ලේඛකාධිකාරී අංශය මගින් නව වැඩ පිළිවෙලක් සකස් කර ඇත. ඒ අනුව ඉදිරියේදී මෙම තත්ත්වය මහහරවා ගැනීමට කටයුතු කරන බව දන්වා සිටිමි. එසේම 2019 හා 2020 තැන්පතු වලින් සැලකිය යුතු ප්‍රමාණයක් මේ වන විට හඳුනාගෙන නිවැරදිව ගිණුම්ගත කර ඇත. | වර්ෂයේ ආදායම් නිසි ලෙස හඳුනාගත යුතු වීම. |
| **(ඇ)**2020 දෙසැම්බර් 31 දිනට වූ රු.31,590,165ක් වූ ප්‍රාග්ධන ප්‍රදාන ක්‍රමක්ෂය කර නොතිබුණු අතර ප්‍රාග්ධන ප්‍රදානවලට අදාල ක්‍රමක්ෂය ගිණුම්ගත කිරීම සඳහා ගිණුම්කරණ ප්‍රතිපත්තියක් ආයතනය විසින් හඳුනාගෙන ගිණුම් සටහන් මගින් හෙළිදරව් කර නොතිබුණි. | ප්‍රාග්ධන ප්‍රධාන වලට අදාල ක්‍රමක්ෂය ගිණුම්ගත කිරීම සඳහා ගිණුම්කරන ප්‍රතිපත්තියක් සකස් කර 2021 වර්ෂයේ ගිණුම් පිළියෙළ කිරීමේ දී ක්‍රමක්ෂය ගිණුම් ගත කිරීම සඳහා කටයුතු කරන බව දන්වා සිටිමි. | අදාල ගිණුම්කරණ ප්‍රතිපත්ති ස්ථාපිත කළ යුතු වීම. |

## 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| මුදල් රෙගුලාසි 371 (ආ) | තත්කාර්ය අතුරු අග්‍රිමයන් ලබාගත්විට අදාල කාර්යය නිමකල විගසම එම වියදම ප්‍රමාදනොකර පියවිය යුතු වුවත් ආයතනය විසින් අවස්ථා 25කදී ලබාදී තිබූ රු.315,420 ක් වූ අත්තිකාරම් මුදල් නිරවුල් කිරීම සඳහා මාස 01 සිට මාස 06 දක්වා කාල පරාසයන් ගතකර තිබුණි. | මෙම අත්තිකාරම් පියවීම ප්‍රමාද වීමට හේතුවූයේ covid 19 සෞඛ්‍ය ව්‍යසන තත්ත්වය නිසා මාස කිහිපයක් කාර්යාලය වසා තැබීමට සිදු වූ නිසා සහ අදාල නිළධාරීන් දුර බැහැර ප්‍රදේශ වල පදිංචිකරුවන් බැවින් ඔවුන්හට සේවයට වාර්තාකිරීමට දුෂ්කර විය. දැනට මෙම තත්ත්වය මගහැරීමට කටයුතු සැලසුම් කර ඇති බැවින් අදාළ අත්තිකාරම් පියවීම නිසි පරිදි සිදු කිරීමට කටයුතු කරන බව දන්වා සිටිමි. | නීති රීති රෙගුලාසි වලට අනුකූලව කටයුතු කල යුතුය |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. රු.13,141,022ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.5,626,205ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.18,767,227 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට පරිපාලන සහ ප්‍රතිස්ථාපන වියදම් පහල යෑම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා වූ ආයතනයේ ක්‍රියාකාරී සැළැස්මට අනුව රන්න, කුරුණෑගල, මාතර සහ රත්නපුර ප්‍රාදේශීය පුහුණු මධ්‍යස්ථානවල 2018/2019 | රන්න ප්‍රාදේශීය පුහුණු මධ්‍යස්ථානයේ 2018/2021 කාලසීමාව තුළ දී පාඨමාලාවන් ආරම්භ කිරීමට ප්‍රමාණවත් අයදුම්පත් නොමැති වීම හේතුවෙන් මෙම පාඨමාලාව | අපේක්ෂිත ඉලක්කයන් ඉටුකර ගැනීමට අදාලව ක්‍රියාකාරී සැළැස්මට අනුව කටයුතුය. |

| | |
|---|---|
| සහ 2019/2020 වර්ෂයන් වෙනුවෙන් උපදේශනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවන් පැවැත්වීමට සැළසුම් කර තිබුණු නමුත් එම පාඨමාලා පැවැත්වීමට කටයුතු කර නොතිබුණු අතර ඒ සඳහා හේතු වූ කරුණු ද කාර්යසාධන වාර්තාවේ දක්වා නොතිබුණි. | ආරම්භ කිරීමට නොහැකි විය. එහෙත් 2021 වර්ෂයේ සිට උපදේශන ඩිප්ලෝමා පාඨමාලාවන් පැවැත්වීමට අයදුම්පත් කැඳවා අයදුම්පත් 40 ක් ලැබුණු අතර සම්මුඛ පරීක්ෂණය 2021 මාර්තු 25 පැවති අතර සිසුන් 22 ක් සහභාගී විය. ඉතිරි සිසුන් සම්මුඛ පරීක්ෂණ වලට සහභාගී නොවූයේ covid 19 වසංගතය නිසාවෙනි. එබැවින් ඉදිරියේදී සෙසු සිසුන්ට ද සම්මුඛ පරීක්ෂණ පවත්වා පාඨමාලාව ආරම්භ කිරීමට නියමිතය. |

## 3.2 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ආයතනයේ අනුමත සේවක සංඛ්‍යාව 102ක් වූ අතර සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට පුරප්පාඩු 36 ක් එනම් සියයට 35ක් විය. ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් තනතුර 2018 වර්ෂයේ සිට පුරප්පාඩු ව පවතින අතර එම තනතුරේ වැඩබැලීම අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (අධ්‍යයන) විසින් සිදුකරනු ලබයි. | ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් තනතුර සඳහා බඳවා ගැනීම අමාත්‍යාංශය මඟින් සිදු කරනු ලබයි. ඒ අනුව අධ්‍යක්ෂ ජනරාල්ගේ බඳවා ගැනීමේ පටිපාටිය සංශෝධනය කිරීමට කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත යොමු කොට ඇත. එය අනුමත වී පැමිණි විගස බඳවා ගැනීම අමාත්‍යාංශයේ පාලන අංශය මඟින් සිදු කරනු ලබයි.<br>ආයතනයේ පුරප්පාඩු සඳහා බඳවා ගැනීම් සිදු කිරීමට 2019 සැප්තැම්බර් 12 දිනැතිව රජයේ ගැසට් නිවේදනය මගින් ඉල්ලුම්පත් කැඳවූව ද භාණ්ඩාගාර ලේකම්ගේ 2019/11/20 හා Dms/policy/Recruitment දරණ ලිපියට අනුව බඳවා ගැනීම් තාවකාලිකව නතර කිරීමට සිදු වූයෙන් බඳවා ගැනීම් සිදු කිරීමට නොහැකි විය. එමෙන්ම 2020 මැයි පාලක සභාව විසින් ආයතනයේ බඳවා ගැනීමේ පටිපාටිය නැවත සංශෝධනය කර සියලු බඳවා ගැනීම් සිදු කරන ලෙස උපදෙස් ලබාදෙන ලදි. ඒ අනුව බඳවා ගැනීමේ පටිපාටිය සංශෝධනය කර අනුමත කර 2021.අප්‍රියෙල් 07 වන දින කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුව මඟින් ආයතනයට එවා ඇත. එයින් පසුව 2021 මැයි 28 ගැසට් පත්‍රය මඟින් තනතුරු සඳහා අයදුම්පත් කැඳවා ඇත. ඉදිරියේදී සම්මුඛ පරීක්ෂණ පැවැත්වීමට සැලසුම් කර ඇත. | කඩිනමින් අදාළ බඳවාගැනීම් සිදුකිරීමට කටයුතු කිරීම. |

**3.3 වාහන පද්ධතිය කළමනාකරණය**

---

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ආයතනයට අයත් කැබ් රථයක් 2019 අගෝස්තු මාසයේ අළුත්වැඩියා කටයුතු සඳහා අදාල නියෝජිත ආයතනයට ලබාදී තිබුණි. මෙම අළුත්වැඩියා කටයුතු වෙනුවෙන් 2020 අගෝස්තු මාසයේදී රු.162,977 ක් අදාල නියෝජිත ආයතනයට ගෙවීම් කර තිබුණද, එම කැබ් රථය ආයතනය වෙත ගෙනැවිත් නොතිබුණි. 2021 වර්ෂයේ ජනවාරි මාසයේදී මෙම වාහනය ධාවනය කිරීමට නොහැකි බව දන්වා වෙන්දේසි කිරීමට අමාත්‍යාංශයෙන් අනුමැතිය ඉල්ලා තිබුණු අතර 2019 වර්ෂයේදී වාහනය අළුත්වැඩියාවට ලබාදීමේදී එම තත්ත්වය නිරීක්ෂණය කර ගැනීමට අපොහොසත්වීම නිසා අළුත්වැඩියාව සඳහා ගෙවන ලද සම්පූර්ණ මුදලම නිශ්කාර්ය වියදමක් වී තිබුණි. | මෙම වාහනය 2019 වර්ෂයේදී වායු සමීකරණ පද්ධතිය හා ඩැෂ් බෝඩය අළුත්වැඩියා කිරීම සඳහා වාහන නියෝජිත ආයතනයට යොමුකල අතර ඒ සඳහා රු.162,577ක් ගෙවීමට සිදුවිය. මෙම සේවාව සිදුකර වාහනය රැගෙන ඒමට යාමේදී මෙහි එන්ජිම ආශ්‍රිතව දෝෂයක් ඇති බව නිරීක්ෂණය වීම නිසා නැවත වාහනයේ එන්ජිම අලුත්වැඩියාව සඳහා නියෝජිත ආයතනයට යොමුකර ඇස්තමේන්තුවක් ලබාගෙන පාලක සභාවට පත්‍රිකා අංක 2019 ඔක්තෝබර් 22 මඟින් ඉදිරිපත් කල නමුත් එය අනුමත නොවූ අතර වාහනය වෙන්දේසි කරන ලෙස පාලක සභාව උපදෙස් දෙන ලදී.<br>ඒ අනුව අමාත්‍යාංශයේ වාහන අපහරණය සිදුකරන විට මෙම වාහනය ද අපහරණය කරන ලෙස ලිඛිතව ඉල්ලීම් කර යැවූ අතර අමාත්‍යාංශය මඟින් ඒ සම්බන්ධව තාක්ෂණ නිලධාරී වාර්තාවක් කැඳවා ඇත. 2021 ජූලි 29 දින වාහනයේ ලිපිගොනුව තාක්ෂණ නිලධාරියා වෙත යොමුකර ඇත. | වාහන පද්ධතිය නිසියාකාරව කළමනාකරණය සිදු කළ යුතුය. |